# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව

## නිවාඩු කාලීන පැවරුම් - 02 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය


සැකසුම - එම්.වී.සම්පත් බන්දු ගුණසේකර - ර/බළ/වෙළහපොළ විද්‍යාලය

<u>වාචික කොටස</u>

1. පස්වග මහණුන්ගේ නම් කියන්න.
2. සිදුහත් බෝසතාණෝ ශරීරයට දැඩිසේ දුක් දුන් ආකාරය විස්තර කරන්න.
3. සිදුහත් බෝසතාණෝ දුෂ්කර ක්‍රියා කිරීම අත්හැරියේ ඇයි?
4. සිදුහත් බෝසතාණෝ දුෂ්කර ක්‍රියා කිරීම අත්හැරීමෙන් පසු සිදුකළේ කුමක්ද?
5. මැදුම් පිළිවෙත යනු කුමක්ද?
6. පසුවග මහණුන් බෝසතාණෝ හැර ගියේ ඇයි?
7. බෝසතාණෝ රන්තලිය ගඟේ පා කර කළ ප්‍රාර්ථනාව කුමක්ද?
8. බෝසතාණෝ ඇසතු බෝමුල අසල සිට කළ ප්‍රාර්ථනාව කුමක්ද?
9. බෝසතාණෝ බුද්ධත්වයට පත්වන අවස්ථාවේ පරිසරයේ සිදුවූ වෙනස්කම් මොනවාද?
10. ත්‍රිවිද්‍යා යනු වෙන් හඳුන්වන්නේ කුමක්ද?

<u>ලිඛිත කොටස</u>

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1.බෝසතාණන්ට කුසතණ පූජා කළේ

1. සර්වමිත්‍ර බමුණාය 2. සොත්ථිය බමුණාය 3. උපකය 4. කොණ්ඩඤ්ඤ

2.බෝසතුන්ට කිරිපිඬු පූජා කළේ කවුද?

1. යසෝදරා දේවිය ය 2. මහමායා දේවිය ය
3. සුජාතා සිටු දියණිය ය 4. භද්දකච්චායනා කුමරිය ය

3.සිදුහත් කුමරු බුද්ධත්වයට පත්වූයේ කමන පෝය දිනයේ ද?

1.වෙසක් 2. පොසොන් 3. ඇසළ 4. නිකිණි

4. බෝසතාණෝ රන්තලිය පාකර හැරියේ කුමන ගඟේ ද?

1.යමුනා ගඟේ ය 2. අනෝමා ගඟේ ය.
3. අචිරවතී ගඟේ ය 4. නේරංජනා ගඟේ ය.

5. මෙයින් ත්‍රිවිද්‍යාවට අයති නොවන්නේ

1. සත්වයන්ගේ උප්පත්තිය හා මරණය දැන ගැනීමේ නුව 2. මතු ආත්මය දැන ගැනීමේ නුවණ
3. පෙර ආත්ය දැන ගැනිමේ නුවණ 4. සියලු කෙලෙස් නැසීමේ නුවණ

- පහත වාක්‍ය හරි නම් ( √ ) ලකුණ ද වැරදි නම් ( x) ලකුණ ද වරහන තුළ යොදන්න.

1. පසුවග මහණුන් බෝසතාණන්ට අකමැත්තෙන් උදවු කළෝ ය. ( )
2. සිදුහත් තවුසාණෝ පිඬුසිඟා වැඩියේ ය. ( )
3. ශරීරයට දැඩිසේ සැප දීම මැදුම් පිළිවෙත නම් විය. ( )
4. සොත්ථිය බමුණා බෝසතුන්ට බැලතණ පූජා කළේ ය. ( )
5. බෝසතාණෝ චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගනිමින් බුද්ධත්වට පත් විය. ( )